# "ගෙවත්තක අසිරි අමතක කරුණු එපා"

මල්ලක් රැගෙන හැන්දෑවට කඩේ යන
දසුනකි සදා මගෙ හදවත දවා ලන
වස විස වලින් තොර වේලක් ලබා දෙන
නිවසේ පෝෂණය වත්තෙන් ලැබ ගන්න

කුණුටික නිසි තැනට නිසි ලෙස දමා ගෙන
නොදිරන දෑ රැගෙන ඉවතට දමා ගෙන
පොහොර කාබනික වත්තෙම හදා ගෙන
කාබනික වගාවක් ඔබ අරඹන්න

රසායන පොහොර වත්තට යොදනු එපා
කෘමිනාශක වල්නාශක යොදනු එපා
කුස්සියේ ඉවතලන දෑ විසි කරනු එපා
ගෙවත්තක අසිරි අමතක කරනු එපා

ඉඩකඩ ඇති ලෙසට බිම සකසා ගන්න
වදුල සහිත තැන් කළුවළි කර ගන්න
සෝදා පාළුව ද වත්තේ වල කන්න
ලස්සන ගෙවත්තක හිමි කරුවෙකු වන්න

නිවසේ මුදල් අපතේ යන්නේද නැත
නැවුම් පලා එළවළු ටික නිබඳ ඇත
රසගුණ දෙකම හැම දේකම රැකෙනු ඇත
පවුලේ සැමොම සුවසේ දිවි ගෙවනු ඇත

ගෙවත්තක අගය හැමටම වැටහේවා!
හැමටම නියම පෝෂණයක් ලැබේවා!
නිරෝගී පරපුරක් රටතුළ ඇතිවේවා!
මතු මහ යෝධයන්, විරුවන් ඉපදේවා!

පද්මිනී හේරත්
කෘෂි විද්‍යා ආචාරිණී
මහ/පරණගම මැද. විදුහල, ජම්බුගහපිටිය